# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.10.26 පැය 2220 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 1948/2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


**වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ඝාතනයේ වෙඩික්කරු අත්අඩංගුවට - පොලිස් මූලස්ථානය.**

2025.10.22 වන දින වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නාඳුනන වෙඩික්කරුවෙකු විසින් වෙඩි තබා ඝාතනය කිරීමේ සිදුවීම සම්බන්ධව පොලිස් කණ්ඩායම් කිහිපයක් මගින් විමර්ශන සිදු කරන ලදී.

ඒ අනුව (26) අද දින අළුයම් කාලයේදී අනුරාධපුර කොට්ඨාසයේ කැකිරාව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනාට හා සැකකාරියට අමතරව පලාගිය ප්‍රධාන සැකකරු අද දින සවස් කාලයේ මහරගම නාවින්න ප්‍රදේශයේදී විශේෂ විමර්ශන කණ්ඩායමක්, පොලිස් විශේෂ කාර්ය බලකාය, රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් හා ප්‍රාදේශීය පොලිස් නිලධාරීන් කණ්ඩායමකගේ ඒකාබද්ධ මෙහෙයුමක් මගින් අත්අඩංගුවට ගන්නා ලදී.

මෙම ඝාතනයට සම්බන්ධ මූලික විමර්ශන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත විසින් සිදු කර තිබූ අතර ඉදිරි දීර්ඝ විමර්ශන මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් සිදු කරන ලදී.

මෙම ඝාතනයට අදාල විමර්ශන කටයුතු පොලිස්පතිතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙහෙයවන ලද අතර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය බුද්ධි සේවය, අණදෙන නිලධාරී පොලිස් විශේෂ කාර්ය බලකාය, නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාව, නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත දකුණ, අධ්‍යක්ෂ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය, අධ්‍යක්ෂ අපරාධ වාර්තා කොට්ඨාසය හා අධ්‍යක්ෂ දක්ෂිණ අධිවේගී මාර්ග සංචාරක කොට්ඨාස මගින් ඒකාබද්ධ මෙහෙයුමක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරු හා සෙසු සැකකරුවන් හා සැකකාරිය වැඩිදුර විමර්ශන සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත භාර දී ඇති අතර එම කොට්ඨාසය මගින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**මෙම ඝාතනයේ ප්‍රධාන වෙඩික්කරු, සෙසු සැකකරුවන් හා සැකකාරිය අත්අඩංගුවට ගැනීම සඳහා මහජනතාව ශ්‍රී ලංකා පොලිසිය වෙත දැක්වූ සහයෝගය ඉතා අගය කොට සළකමු.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**